# නර්තනය - 9 ශ්‍රේණිය

**(පළමු වාරය )**



The National e-learning Portal for the General Education

නර්තනය - 9 ශ්‍රේණිය

ඒකකය - ජන ගායනා ගායනා කරමු (සිංහරාජ වන්නම)

පැවරුම් අංක 6

## සිංහරාජ වන්නම



මෙම වන්නම නර්තනය කිරීමට ප්‍රථම එයට අදාල තාල රූපයත්, බෙර පදයත් මූලිකව හඳුනාතග යුතුයි. එයට අනුකූලව නිවැරදි නාද මාලාව අනුගමනය කරමින් වන්නමේ කවි ගායනා කිරීම වඩාත් යෝග්‍ය වේ. අපි මාත්‍රා 4 න් 4 ට තාල තබමින් සිංහරාජ වන්නම ගායනා කරමු.

තාල රූපය - මාත්‍රා 4 මහ තනි තිත

බෙර පදය - දොදොංත තකු දොං

තානම - තනත් තනෙන තම් දනත් තනෙන තම්

දනත් තනෙන තම් දන තා -නා - තන

තනත් තනෙන තම් දනත් තනෙන තම්

දනත් තනෙන තම් දන තා-නා

කවිය - පෙරත් කලෙක සිහ රජෙක් වැවුණි මහ
ලිදක් තුලෙක ඉබි ලඩෙක් කරපු වැඩ
හැරත් මෙහෙම යස වැඩක් උනේ නැත
චිරත් කලෙක පැවතුමක් යසයි හැඩ

දුරත් බැලුම නොව ලගත් බලන අය
හටත් එලෙස වෙයි කැටත් තබමි දඩ
වටත් අයට දැනෙනටත් කියමි මම
රටක් වටින සිහ රජ වන්නමෙ හැඩ

කස්තිරම - තකට තකට තක තරිකිට කුන්දත් ///
රුංතක ජිංතක ජිංතක ජිං කුද ///
තාක් ගජිං තක තරිකිට කුන්දත් //
රුංතක ජිංතක තරිකිට කුන්දත් තා

සීරුමාරුව - තකුතක ජිජි කුද ගජිත ගජිත කුද ගජිගත දොද් දොං තා
තරිකිට දොද් දොං තා // තරිකිට දොද් දොං
තා කුජිත්ත ගත දොමිකිට තරිකිට කුන්දත් තා

අඩව්ව - තාම් දොමිතිගත දොමිකිත කඩතක තරිකිට
කිතක දොමිති ගත කිත් තත් කුද කුද
තා කුජිත්ත ගත දොමිකිත තරිකිට කුන්දත් තා

## ක්‍රියාකාරකම

1. සිංහරාජ වන්නමේ තාල රූපය කුමක්ද?

2. සිංහරාජ වන්නමේ බෙර පදය ලියන්න.